# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | |
|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | |
| ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 | |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | |
| වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 261/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 13/02/2024<br>පැය 1055 |

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. 2024.02.12 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 02 | 11.75 | 933 | ගෑස් ලිප් 01<br>ගෑස් සිලින්ඩර් 01<br>තඹ දඟර 02<br>යකඩ බැරල් 02<br>රබර් බට 04 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වාලච්චේන කඳවුර.**

2024.02.12 වන දින රාත්‍රී කාලයේ වාලච්චේන පොලිස් වසමේ සමෘද්ධි වීදිය ප්‍රදේශයේ දී පොලිස් විශේෂ කාර්ය බලකා වාලච්චේන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 01 මිලි ග්‍රෑම් 920 ක් ජංගම දුරකථන 02ක්, සිම්පත් 03ක් හා ජාවාරමෙන් උපයාගත් බවට සැකකරන මුදල් රුපියල් 265,000/-ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වාලච්චේන පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වූ වාලච්චේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** වාලච්චේන පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. විදේශ රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් අංශය.**

2024.02.12 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් අංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත රුවන්වැල්ල පොලිස් වසමේ වැලිපිටිය ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර විදේශ රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන රුවන්වැල්ල පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වූ මත්තමගොඩ, කොටියාකුඹුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

රුවන්වැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. මෙරට නිෂ්පාදිත ගිනි අවි 02 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කන්තලේ කඳවුර.**

2024.02.12 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කන්තලේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත අග්බෝපුර පොලිස් වසමේ 18 වැව අසලදී වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවි 02ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන අග්බෝපුර පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 23 හා 26 වයස් වල පසුවන අග්බෝපුර හා පේරාරු ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

අග්බෝපුර පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**